SRI LANKA

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# AA1 විභාගය - 2020 ජනවාරි

# යෝජිත උත්තර
# (AA13)

# ව්‍යාපාර සහ ගිණුම්කරණය සඳහා ආර්ථික විද්‍යාව
# (EBA)

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය
නො. 540, පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.

දුරකථන : 011-2-559 669

මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි.

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශය

# AA1 විභාගය - 2020 ජනවාරි

# (AA13) ව්‍යාපාර සහ ගිණුම්කරණය සඳහා ආර්ථික විද්‍යාව

# යෝජිත උත්තර

**A කොටස**

**වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)**

**අනිවාර්ය ප්‍රශ්න විස්ස (20) කි.**

**(මුළු ලකුණු 40)**

## 1 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

| ප්‍රශ්න අංකය | උත්තරය |
|---|---|
| 1.1 | 4 |
| 1.2 | 2 |
| 1.3 | 2 |
| 1.4 | 4 |
| 1.5 | 4 |
| 1.6 | 4 |
| 1.7 | 3 |
| 1.8 | 2 |
| 1.9 | 2 |
| 1.10 | 1 |
| 1.11 | අසත්‍ය |
| 1.12 | සත්‍ය |
| 1.13 | සත්‍ය |
| 1.14 | සත්‍ය |
| 1.15 | සත්‍ය |
| 1.16 | හීනවන |
| 1.17 | පටු |
| 1.18 | දිගු කාලයේ දී |
| 1.19 | ආන්තික පිරිවැය |
| 1.20 | ප්‍රාග්ධන සමුච්චය |

***(එක් කොටසකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 40)***

***A* කොටසෙහි අවසානය.**

**B කොටස**

අනිවාර්ය ප්‍රශ්න හතරකි. (04)

(මුළු ලකුණු 40)

## 2 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

| 01 පරිච්ඡේදය - ව්‍යාපාර ආර්ථික විද්‍යාව හැඳින්වීම |
|---|

(a) (i) **හිඟකම**

හිඟකම යනු අසීමිත මානව අවශ්‍යතා සහ සීමිත සම්පත් අතර පරතරයයි.

සියලුම මිනිස් අවශ්‍යතා සපුරාලීම සඳහා සියලු භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමට පවතින සම්පත් ප්‍රමාණවත් නොවන බව එයින් පැහැදිලි කරයි. ***(ලකුණු 02)***

(ii) ආර්ථික සම්පත් සීමිත වන අතර මිනිසුන්ට අවශ්‍ය සියලුම භාණ්ඩ හා සේවා ඔවුන්ට ලබාගත නොහැක. එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන් තෝරා ගැනීමක් කළ යුතුය. තේරීමක් සිදුවන සෑම අවස්ථාවක දී ම යම් දෙයක් අත්හැරිය යුතුය. ආවස්ථික පිරිවැය යනු, අත්හරින හොඳම විකල්පයේ වටිනාකමයි. පවතින විකල්පයන් අතර තේරීම් සිදු කිරීමට මිනිසාට සිදුවන සෑම අවස්ථාවක දී ම ආවස්ථික පිරිවැය පැනනගී. ***(ලකුණු 03)***

(b) 1. සම්පත් වල අයිතිය සාමාන්‍යයෙන් රාජ්‍ය / පොදු අයිතියට යටත් වන අතර නිෂ්පාදන ඉපැයීම් වඩාත් සාධාරණ ලෙස නිෂ්පාදන සාධක අතර බෙදීයාම සඳහා රජය ක්‍රියාකරනු ඇත.

2. ආර්ථිකය මුහුණ දෙන මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගනු ලබන්නේ "මධ්‍යම සැලසුම් අධිකාරියක්" (Centralized Planning Committee) විසින් දෙනු ලබන නියෝග මගිනි.

3. මධ්‍යම සැලසුම් අධිකාරිය තද නීති රීති යොදාගනිමින් ආර්ථික ප්‍රශ්න විසඳීමට ප්‍රයත්න දරණ බැවින් නිදහස් ව්‍යවසායක් හෝ පාරිභෝගික ස්වාධිපත්‍යයක් ආර්ථිකය තුළ දක්නට නොලැබේ.

4. ජනතාවගේ මූලික අවශ්‍යතා සපුරාලීම, සාධාරණත්වය, මිල ස්ථායීතාවය යනාදී අරමුණු ඉටුකර ගැනීම සඳහා ආර්ථික ක්‍රමය මෙහෙයවනු ලැබේ.

5. සම්පත් බෙදීයාමේ විෂමතාවයක් නොමැතිවීම, පංතිභේදය නොමැතිවීම යනාදිය මෙම ක්‍රමය තුළ දක්නට ලැබෙන යහපත් ලක්ෂණ වේ.

6. සමාජ සුභසාධනය උපරිම කිරීමේ අරමුණින් ආර්ථික ක්‍රමය ක්‍රියාත්මක කරවන බැවින් පරිසරයට හානියක් නොකරන බවට විශ්වාස කරයි.

7. භාණ්ඩ හා සේවාවල මිල තීරණය කරනු ලබන්නේ මධ්‍යම සැලසුම් අධිකාරිය මගිනි. එයින් භාණ්ඩ හා සේවාවල මිලට නාමික ලාභ ප්‍රතිශතයක් එක් කරන අතර එය වෙළෙඳපොල තත්ත්වයන්හී වෙනස්වීම් මත පදනම් නොවේ. මෙසේ ලාභ ප්‍රතිශතයක් එක් කිරීමට හේතු වන්නේ, රජයට ජනතාව වෙනුවෙන් මූල්‍යමය ප්‍රතිලාභ නොලැබෙන වියදම් දැරීමට සිදුවීමයි. එවැනි වියදම් වලට අරමුදල් සපයා ගැනීමට ලාභ ප්‍රතිශතයක් භාණ්ඩ හා සේවා වලින් අයකරනු ලබයි. එවැනි වියදම් වනුයේ,
   - පර්යේෂණ සහ සංවර්ධන වියදම්
   - ජාතික ආරක්ෂණ වියදම්
   - අධ්‍යාපනය වෙනුවෙන් දරණ වියදම්
   - සෞඛ්‍ය සේවාවන් සඳහා දරණ වියදම්

8. තරගකාරී වෙළෙඳපොළවල් නොමැත.

9. මිල යාන්ත්‍රණයක් නොමැත.

10. ලාභ අරමුණක් නොමැත. ***(ලකුණු 05)***

***(මුළු ලකුණු 10)***

## 3 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

02 පරිච්ඡේදය - පාරිභෝගික හැසිරීම සහ වෙළෙඳපොළ

(a) (i)

| | | |
|---|---|---|
| Qd | = | 1500 - 6p |
| Qs | = | -100 + 2p |

| | | | |
|---|---|---|---|
| සමතුලිතයේ දී | Qd | = | Qs |
| | 1500 - 6p | = | -100 + 2p |
| | 1600 | = | 8p |
| | 1600/8 | = | p |
| | **200** | **=** | **P** |

**සමතුලිත මිල = රු. 200/-**

P = 200, Qd සමීකරණයට ආදේශ කළ විට

| | | |
|---|---|---|
| Qd | = | 1500 - 6p |
| Qd | = | 1500 - (6 x 200) |
| Qd | = | 1500 - 1200 |
| **Qd** | **=** | **300** |

**සමතුලිත ප්‍රමාණය = ඒකක 300**


***(ලකුණු 03)***

(ii) පාරිභෝගිකයාගේ ආදායම වැඩිවුවහොත් වෙළෙඳපොළ ඉල්ලුම ඉහළ නගිනු ඇත. පාරිභෝගිකයාගේ ආදායම වැඩි වන විට මිලදී ගැනීමේ හැකියාව වැඩිවීම නිසා භාණ්ඩයෙන් වැඩි ඒකක සංඛ්‍යාවක් ඔවුන් විසින් මිලදී ගනී.

මෙමගින් ඉල්ලුම් වක්‍රය දකුණු පසට විතැන් වන අතර අධි ඉල්ලුමක් ඇති වේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය ඉහළ නගී.

***(ලකුණු 02)***

(b)




ආන්තික ආදායම ආන්තික පිරිවැයට සමාන වන අවස්ථාවේ දී ලාභය උපරිම වේ. මෙම අවස්ථාවේ දී භාණ්ඩයේ විකුණුම් මිල සාමාන්‍ය පිරිවැයට වඩා වැඩිවනු ඇත.

*(ලකුණු 05)*

*(මුළු ලකුණු 10)*


## 4 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

| 04 පරිච්ඡේදය - වෙළඳපල ක්‍රමය තුල රජයේ කාර්යභාරය |
|---|

(a) **උපරිම මිල**

මෙය පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සඳහා රජය විසින් භාණ්ඩයක හෝ සේවාවක සමතුලිත මිලට වඩා අඩුවෙන් පැනවූ නීතිමය මිලකි.

උපරිම මිලට වඩා වැඩිවන ඕනෑම මිලක් නීතිවිරෝධී වන අතර එය කලුකඩ මිල ලෙස හැඳින්වේ. උපරිම මිල ප්‍රතිපත්තිය හේතුවෙන් ඇතිවන ප්‍රධාන ආර්ථික ප්‍රතිවිපාකය වන්නේ වෙළෙඳපොළේ ඇති අතිරික්ත ඉල්ලුම සහ වෙළෙඳපොළේ ඇති භාණ්ඩ හිඟය හේතුවෙන් ඇතිවන අහිතකර ප්‍රතිඵලයි.




අවම මිල

නිෂ්පාදකයින් දිරිමත් කිරීම සඳහා භාණ්ඩයක හෝ සේවාවක සමතුලිත මිලට වැඩියෙන් රජය විසින් පනවන මිලයි. අවම මිල නීතිමය මිලක් ලෙස නොසැලකෙන නිසා නිෂ්පාදකයන්ට ඔවුන්ගේ නිෂ්-පාදන අවම මිලට වඩා අඩුවෙන් හෝ වැඩියෙන් විකිණීමට අයිතිය ඇත.

ඉල්ලුමේ හා සැපයුමේ වෙළෙඳපොළ බලවේග විසින් තීරණය කරනු ලබන මිල නිෂ්පාදකයින්ට අසාධාරණ යැයි රජය සලකන විට අවම මිලක් නියම කරනු ලැබේ. එය සමතුලිත මිලට වඩා ඉහළින් පිහිටයි.

අවම මිල හේතුවෙන් ඇතිවන ප්‍රධාන ආර්ථික ප්‍රතිවිපාකය වන්නේ වෙළෙඳපොළේ ඇති අතිරික්ත සැපයුම සහ වෙළෙඳපොළේ ඇති අතිරික්ත භාණ්ඩ නිසා ඇතිවන අහිතකර ප්‍රතිඵලයි. අවම මිල ප්‍රතිපත්තිය පහත රූපසටහනෙන් දැක්විය හැකිය.




(b)

(1) **අයවැය හිඟය මූල්‍යනය කිරීම**

අයවැය හිඟය පියවා ගැනීමට රජය දේශීය මෙන්ම විදේශීය ණය උපකරණ නිකුත් කරනු ලැබේ. හිඟය ඉතා ඉහල මට්ටමක පවතී නම්, ඉහල පිරිවැයක් (පොළියක්) යටතේ ණය ලබා ගැනීමට රජයට සිදුවේ. ඉහල පොලියක් යටතේ ලබා ගන්නා ණය පියවීමට අනාගතයේදී, බදු ඉහල දැමීමටද සිදුවනු ඇත.

(2) **දිගින් දිගටම ඉහළ යන රාජ්‍ය ණය**

දිගින් දිගටම ණය ලබාගත්විට දිගුකාලයේදී ඉතා ඉහල සමුච්චිත ණය වගකීමක් ඇති වේ. ඒ අනුව, ණය සඳහා ගෙවිය යුතු පොළිය දිගින් දිගටම ඉහල යයි. වෙනත් ඵලදායී කටයුතු සඳහා දැරිය හැකිව තිබූ වියදම, පොළී සඳහා ගෙවීමෙන් ආර්ථිකයට විශාල ආවස්ථික පිරිවැයක් දැරීමට සිදුවේ. උදාහරණයක් ලෙස සෞඛ්‍ය සේවා සඳහා වන වියදම වැඩි කිරීමට හැකි වේ.

(3) **රාජ්‍ය වියදම අපතේ යාම**

ඉතා ඉහල රාජ්‍ය වියදම, බොහෝ ආර්ථික විශේෂඥයන් එකග නොවන කරුණකි. ඔවුන් විශ්වාස කරනුයේ, දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය වියදම ඉහල ගිය විට එය පුද්ගලික අංශයේ වර්ධනය සඳහා අහිතකර බලපෑමක් ඇති කරන බවයි.

(4) **රජය විසින් කරනු ලබන සුබසාධන වියදම් අඩුවීම**

රටේ සුබසාධන වියදම් කපා හැරීමට එය බලපාන අතර රජය විසින් රටේ බදු ආදායම වැඩි කළ යුතුය.

(5) **ආර්ථික වර්ධනය පහළ බැසීම**

අඛණ්ඩ අයවැය හිඟය නිසා ආර්ථික වර්ධනය මන්දගාමී වේ.

(6) **උද්ධමනය වැඩිවීම**

විදේශ මුදල් අවප්‍රමාණය වීම නිසා භාණ්ඩ හා සේවා මිල ඉහළ යයි. එය උද්ධමනය වැඩි කිරීමට බලපායි.

(7) **එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව දේශීය මුදල් අවප්‍රමාණය කිරීම**

ණය පියවීම සඳහා රජය විසින් විදේශ සංචිත භාවිත කළ යුතුය. එහි ප්‍රතිඵලයක් ලෙස විදේශ සංචිත අඩු වන අතර ශ්‍රී ලංකාවේ රුපියල් එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව අවප්‍රමාණය වනු ඇත.

*(ලකුණු 06)*

*(මුළු ලකුණු 10)*

## 5 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

05 පරිච්ඡේදය - මුදල් හා මිල මට්ටම

(a) (i) **මුදලේ කාර්යයන්**

මුදලේ කාර්යයන් පහත පරිදි වේ.

**විනිමය මාධ්‍යයක් ලෙස ක්‍රියා කිරීම** - මින් අදහස් කරන්නේ ආර්ථිකයේ පොදු විනිමය මාධ්‍යයක් ලෙස ක්‍රියා කරමින් භාණ්ඩ හා සේවා හුවමාරුව කාර්යක්ෂම කෙරෙන පදනම සැපයීමයි. මෙය මුදලේ ප්‍රධානතම කාර්යය වන අතර, අනෙකුත් කාර්යයන් මුදල් ඒකකයක් තුළින් ඉටුකර ගත හැක්කේ මෙය සාර්ථකව ක්‍රියාත්මක වන්නේ නම් පමණි. මේ නිසා, එක් භාණ්ඩයක් තවත් භාණ්ඩයක් හා හුවමාරු කිරීමේදී පැවති වුවමනාවන් ගැලපීමේ ගැටලුව මුදල් මගින් නිරාකරණය වීම සිදු වෙයි.

**වටිනාකම රැස්කිරීමේ මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම** - පුද්ගලයාට සිය එදිනෙදා ආර්ථික කටයුතුවලින් උපයන ආදායමින් කොටසක් අනාගත පරිභෝජනය සඳහා භාවිතා කිරීමට මුදල් භාවිතා කළ හැකි වේ. මුදල් අනාගතයේදී භාණ්ඩ මිලදී ගැනීමට භාවිතා කරන නිසා එය වටිනාකමේ සන්නිධියක් ලෙස සලකනු ලැබේ.

**වටිනාකම මැනීමේ මිනුමක් ලෙස ක්‍රියා කිරීම (ගිණුම් ඒකකයක් ලෙස ක්‍රියා කිරීම)** - එනම් ආර්ථිකයක භාණ්ඩ හා සේවාවල වටිනාකම මැනීමේ පොදු මාධ්‍යය ලෙස මුදල් භාවිතා කිරීම අදහස් වේ. භාණ්ඩයක හෝ සේවාවක වටිනාකම "මිලෙන්" ප්‍රකාශ කරන අතර මෙය මුදලින් මැන දක්වනු ලබයි.

**කල් තැබූ ගෙවීම් පියවීමේ මාධ්‍යයක් ලෙස ක්‍රියා කිරීම (විලම්බිත ගෙවුම් මාධ්‍යයක් ලෙස ක්‍රියා කිරීම)** - එනම් වර්තමානයේදී සිදුකරනු ලබන භාණ්ඩ හා සේවා හුවමාරු කිරීම් අනාගත භාණ්ඩ හා සේවා සඳහා හුවමාරු කිරීම පහසු කරලීමයි. නැතිනම් වර්තමානයේදී සිදුකරන ණය ගණුදෙනු අනාගතයේදී මුදල් මාධ්‍යය කරගෙන පියවීමේ හැකියාවයි.

*(ලකුණු 03)*

(ii) මිල මට්ටම සහ මුදලේ වටිනාකම අතර සම්බන්ධතාවය වන්නේ මිල මට්ටම ඉහළ යන විට මුදලේ අගය පහත වැටීමයි. මුදලේ වටිනාකම යනු මුදල් ඒකකයකට මිලදී ගත හැකි දේ වන අතර මිල මට්ටම යනු දෙන ලද ආර්ථිකයක භාණ්ඩ හා සේවාවල මිල ගණන්වල සාමාන්‍යයයි. මිල මට්ටම ඉහළ යන විට මුදලේ වටිනාකම පහළ යයි.

*(ලකුණු 03)*

08 පරිච්ඡේදය - අන්තර්ජාතික වෙළෙඳාම

(b) (i) **ආරක්ෂණවාදය**

ආරක්ෂණවාදය යනු, ජාත්‍යන්තර වෙළෙඳාමට අදාළ තීරු බදු හා තීරු බදු නොවන බාධක හරහා දේශීය කර්මාන්ත, විදේශීය තරගවලින් ආරක්ෂා කිරීමේ ආර්ථික ප්‍රතිපත්තියයි. ආනයන අධෛර්යමත් කිරීම සඳහා වන ආනයන මත තීරුබදු, සීමිත කෝටා සහ විවිධ රාජ්‍ය රෙගුලාසි මෙයට ඇතුළත් වේ.

**(ලකුණු 02)**

(ii) **ආරක්ෂණවාදී ක්‍රියාමාර්ගවල වාසි**

- දේශිය නිෂ්පාදකයන්ට විදේශ රටවලින් ඇති කරන අමතර තරගකාරිත්වයෙන් ආරක්ෂාවීම.
- ළදරු කර්මාන්ත වර්ධනය විමට පෙර ඇතිවිය හැකි තරගකාරිත්වයෙන් ආරක්ෂාවීම
- ආර්ථිකය තුල රැකියා අවස්ථා ආරක්ෂා කිරීමට සහය විම.
- භාවිතයට නුසුදුසු ඉතා ලාභදායි ලෙස සපයන ආනයන වැළැක්වීමට හේතුවිම.
- හානිදායක සහ අහිතකර භාණ්ඩ රටතුලට ඒම වැළැක්වීම.
- ආනයන සිමා කිරිම තුලින් ගෙවුම් ශේෂ දුෂ්කරතා මගහරවා ගැනිමට සහය වීම.

**(ලකුණු 02)**

**(මුළු ලකුණු 10)**

**B කොටසෙහි අවසානය.**



aat SRI LANKA

**C කොටස**

අනිවාර්ය ප්‍රශ්නයකි.

(මුළු ලකුණු 20)

## 6 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

**06 පරිච්ඡේදය - බැංකු සහ මූල්‍ය ප්‍රතිපත්තිය**

(A) (a) **ගුණාත්මක පාලනයන්**

- ශිෂ්ඨ ප්‍රයෝග ක්‍රියාත්මක කිරීම
- වාණිජ බැංකු ණය සඳහා උපරිම කල්පිරීමේ කාල නියම කිරීම
- ශීර්ෂ පිළිබඳ උපරිම සීමා පැනවීම
- ප්‍රති මූල්‍ය පහසුකම් ඇති කිරීම
- වරණ පොළී අනුපාත නියම කිරීම

*(ලකුණු 03)*

(b) **මූල්‍ය අතරමැදිකරණය**

මූල්‍ය ආයතන ආර්ථිකයක සිදුකරන ප්‍රධාන කාර්යභාරය වනුයේ මුදල් අතිරික්තයක් ඇති පාර්ශව වෙතින් මුදල් ඌනතාවයක් (අවශ්‍යතාවයක්) ඇති පාර්ශව වෙත අරමුදල් හුවමාරු කිරීමයි. එමනිසා, මූල්‍ය අතරමැදි ආයතන, මෙලෙස මුදල් අතිරික්තයක් ඇති පාර්ශව වලින් තැන්පතු භාරගෙන මුදල් අවශ්‍යතාවයක් ඇති පාර්ශව වෙත ණය සැපයීම තුලින් අතරමැදි කාර්යයක් ඉටුකරනු ලබයි. තැන්පතු සඳහා ගෙවන පොළියත්, ණය සඳහා ලබා ගන්නා පොළියත් අතර පරතරයෙන් එම ආයතන තම ප්‍රධාන ආදායම උපයාගනී. මූල්‍ය අතරමැදිරණය පහත පරිදි නිරූපණය කළ හැකිය.




*(ලකුණු 03)*

| 07 පරිච්ඡේදය - සාර්ව ආර්ථිකය සහ ව්‍යාපාර පරිසරය |
|---|

(B) (a) **මූලික මිලට දළ (සමස්ත) එකතු කළ අගය (GVA)**

| අයිතමය | රු. (මිලියන) |
|---|---|
| කෘෂිකර්මය, වන වගාව සහ ධීවර කර්මාන්තය | 10,000 |
| පතල් හා කැණීම්, නිෂ්පාදන කර්මාන්ත, විදුලිය හා ජල නිෂ්පාදන කටයුතු හා වෙනත් කර්මාන්ත | 7,500 |
| ඉදිකිරීම් | 20,000 |
| තොග සහ සිල්ලර වෙළෙඳාම ප්‍රවාහනය, ගබඩා කිරීම, නවාතැන් සැපයීම් හා ආහාර සැපයීම් සේවා | 2,500 |
| තොරතුරු සහ සන්නිවේදන සේවා | 23,000 |
| මූල්‍ය සහ රක්ෂණ සේවා | 2,500 |
| නිවාස අයිතිය ඇතුළුව දේපළ වෙළෙඳාම | 4,550 |
| වෘත්තීය සේවා, විද්‍යාත්මක, තාක්ෂණික, පරිපාලන සහ උපකාරක සේවා ක්‍රියාකාරකම් | 3,575 |
| රාජ්‍ය පරිපාලනය, ආරක්ෂක, අධ්‍යාපනය, මානව සෞඛ්‍ය සහ සමාජ සේවා කටයුතු | 15,000 |
| වෙනත් සේවා | 5,600 |
| **මූලික මිලට දළ (සමස්ත) එකතු කළ අගය** | **94,225** |

***(ලකුණු 06)***

(b) **වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය (GDP)**

| | |
|---|---|
| **මූලික මිලට දළ (සමස්ත) එකතු කළ අගය** | **94,225** |
| එකතු කළා : නිෂ්පාදිත මත බදු | 5,600 |
| අඩුකළා : නිෂ්පාදිත මත සහනාධාර | (3,250) |
| **වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය** | **96,575** |

***(ලකුණු 04)***

(c)

| 09 පරිච්ඡේදය - ආර්ථික වර්ධනය හා සංවර්ධනය |
|---|

**ආර්ථික සංවර්ධනය සහ චිරස්ථායි සංවර්ධනය අතර ඇති වෙනස**

ආර්ථික සංවර්ධනය යනු, භාණ්ඩ හා සේවා නිෂ්පාදනය වැඩිවීමත් සමග සමස්ත සමාජ පද්ධතියේ ම සිදුවන දියුණුවයි.

චිරස්ථායි සංවර්ධනය යනු, අනාගත පරපුරට ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීමේ අවස්ථාව අහිමි නොකරමින් වර්තමාන අවශ්‍යතා සපුරාලීම උදෙසා වන සංවර්ධනයයි.

***(ලකුණු 04)***

***(මුළු ලකුණු 20)***

**C කොටසෙහි අවසානය.**

***Notice :***

These answers compiled and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.
These should be understood as Suggested Answers to question set at AAT Examinations and should not be construed as the "Only" answers, or, for that matter even as "Model Answers".
The fundamental objective of this publication is to add completeness to its series of study texts, designs especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well as stay relevant in the art of answering questions at examination level.

*© 2020 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*
*All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*